# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# (PGIM)

# කොළඹ විශ්වවිද්‍යාලය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා මණ්ඩල සහතිකය හෝ වෛද්‍ය විශේෂඥ ආචාර්ය උපාධියක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධ්‍යාපනික හා පරිපාලන ක්ෂේත්‍රයන්හි පෙර පළපුරුද්ද අමතර සුදුසුකමකි. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර PGIM හි පූර්ණ කාලීන නිලධාරියෙකි. නිල කාලය වසර තුනකි. වයස අවුරුදු 62 ට අඩු අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන අතර, 2024-11-30 දිනට වයස අවුරුදු 65 නොඉක්මවිය යුතුය.

**වැටුප සහ වෙනත් පත්වීම් කොන්දේසි**

[U-AC3(II)] - රු. 79,360 - 11x1630 - 97,290 මාසිකව

- තෝරාගත් අයදුම්කරුට වැටුපට අමතරව, අධ්‍යයන දීමනාව සහ ජීවන අංක දීමනාව ගෙවනු ලැබේ.

ඔබගේ වෘත්තීය අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා, කරුණාකර, සහතිකවල ඡායා පිටපත්, අයදුම්පත් සමග අමුණා ඉදිරිපත් කරන්න.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මගින් අයදුම් කළ යුතුය. මෙම අවශ්‍යතාව තහවුරු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තෝරාගත් අයදුම්කරු රජයේ විශ්‍රාමික නිලධාරියෙකු නම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයන්ගේ නියමයන් සහ ප්‍රතිපාදනයන්ට අනුව ඔහුට/ ඇයට PGIM නියෝජ්‍ය අධ්‍යක්ෂ ධූරය දරන කාලය තුළ එම ධූරයට අදාළ වේතන හා දීමනාවන්ට අමතරව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකමක් නොමැත.

රැකියා විස්තරය අයදුම් පත්‍රය, ඇතුළු වැඩිදුර තොරතුරු, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියෙන් (pgim.cmb.ac.lk) ලබාගත හැක.

යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමඟ saradmin@pgim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කිරීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපැලෙන්, කොළඹ 07, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, අංක 160, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ආයතන හා සමාන්‍ය පරිපාලන අංශය, ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර් වෙත 2024-11-30 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම් කරන තනතුර විද්‍යුත් තැපැල් ලිපියේ විෂය ලෙස දැක්විය යුතු අතර, නැතහොත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2024-11-10**